# 21. සමාව අයැදිමු

එක් පවුලක පුත්තු දෙදෙනෙක් සිටියා.

ලොකු පුතා තාත්තාට කීකරුයි.

බාල පුතා සැම විට ම තාත්තාට කීකරු වුණේ නැහැ.

දවසක් දා බාල පුතා ගෙදරින් පිට වී

වෙනත් පළාතකට ගියා. ඒ පළාතේ ඔහුට

නරක යාළුවෝ සිටියා. ඒ යාළුවෝත් එක්ක කාලා, බීලා විනෝද

වෙලා මුදල් සියල්ල ම වියදම් කළා.





දැන් ඔහුට සල්ලිත් නැහැ. යාළුවොත් නැහැ. කන්න අඳින්නත් නැහැ.

ඔහු තනි වුණා. ඔහුට ගෙදර මතක් වුණා.

තාත්තාව, මතක් වුණා. අයියා ව මතක් වුණා.

ඔහුට ගෙදර එන්න සිතුණා.

"ඒත් කොහොමද ගෙදර එන්නේ? තාත්ත ගහල පන්නයි ද?"

ඔහු සිතුවා.

"නෑ තාත්තා හරි හොඳයි"

කියා ඔහු තමාට ම කියා ගත්තා.



ඔහු තාත්තාව සොයා ගෙන ගෙදර ආවා.
දුර තියාම තාත්තා පොඩි පුතාව හඳුනා ගත්තා.
දුවලා ගිහින් පුතාව පිළිගත්තා.
"අනේ තාත්තේ මට සමාවෙන්න, මම තාත්තාට අකීකරු වුණා."
ඔහු තාත්තාගේ දෙපා වැඳලා සමාව ඉල්ලුවා.
තාත්තා ඔහුව පන්නා ගත්තේ නැහැ. හිරිහැර කළේ නැහැ.
ඔහුට සමාව දුන්නා. ආදරයෙන් පිළිගත්තා.

## පැවරුම්

1. මව් පියන් ළමුන්ට ආදරේ බව දන්නේ කොහොම ද?
2. තමුන් අතින් වරදක් වුවහොත් කුමක් කළ යුතු ද?